# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,130 — 1960 මැයි 13 වැනි සිකුරාද — 13.5.1960**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස—ඉඩම්

**(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)**


| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල්කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 213 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 217 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාලගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිසාවේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කොළඹ නාගරිකයේ කුරුඳුවත්ත කොට්ඨාශය තුළ පිහිටි හෝර්ටන් පෙදෙස වරිපනම් අංක 42 දරණ ප්‍රමාණයෙන් රූඩ්ස් 3ක් පමණවූ "ට්‍රෙවයින්". නමැති බිම් කැබැල්ලට මායිම් වශයෙන් :—

උතුරට : හෝර්ටන් පෙදෙස ; නැගෙනහිරට : ආර්. ඊ. ප්‍රනාන්දු මහතා විසින් අයිතිකම් කියනු ලබන හෝර්ටන් පෙදෙස වරිපනම් අංක 44 දරණ "ට්‍රෙවයින්" නමැති ස්ථානය ; දකුණට : ජේ. ඇල්. සී. පීරිස් මහතා විසින් අයිතිකම් කියනු ලබන ග්‍රෙගරි පාරේ වරිපනම් අංක 19 දරණ "ෂාන්ති" නමැති ස්ථානය ; බස්නාහිරට : බී. මහාදේව මහතා විසින් අයිතිකම් කියනු ලබන අරුණාචලම් මාවතේ වරිපනම් අංක 1 දරණ "පොන්ක්ලයාර්" නමැති ස්ථානය, තම්බයියා නෝනා මහත්මිය විසින් අයිතිකම් කියනු ලබන අරුණාචලම් මාවතේ වරිපනම් අංක 5 දරණ "නිලයන්මුරුගා" නමැති ස්ථානය සහ වී. රාම නාදන් නෝනා මහත්මිය විසින් අයිතිකම් කියනු ලබන අරුණාචලම් මාවතේ වරිපනම් අංක 9 සහ 11 දරණ "නිලාවි" නමැති ස්ථානය.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

අංකය : ජේ 59/60 එස් 260 ; ආර්/කිව් 289.
1960ක්වූ මාර්තු මස 28 වැනි දින,
කොළඹදීය.

---

### 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා

ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ ඩබ්ලිව්. දහනායක නැමති මම මෙයින් ප්‍රකාශ කරමි:

කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ දික්ඕවිට පිහිටි මුදියාන්සේගෙවත්ත නමැති ඉඩමෙන් පර්චස් 7 49/121ක් පමණ ඇති බිම් කැබැල්ලක්, ඊට මායිම්:—

උතුරට: එම ඉඩමේම කොටසක්; නැගෙනහිරට: අගල; දකුණට: බී. ඇෆ්. රුද්‍රිගෝ මහත්මිය සහ තවත් අය අයිතිකම් කියන දික්ඕවිට වත්ත; බස්නාහිරට: මුහුදු වෙරළ.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960ක් වූ පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹදීය.

---

අංකය: ඇල්එච්/ඒ. 4078.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාලගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

කළුතර දිස්ත්‍රික්කයේ බටහිර පස්යොදුන් කෝරළයේ ආදායම් පාලක කොටසේ, මතුගම පිහිටි අ. 0, රූ. 3, ප. 13ක් පමණ වූ කොස්වත්තගොඩලන්ද, කැටකැරල්ලගහලන්ද සහ අළුබෝගහ දෙනිය නම් ඉඩම් කට්ටියට මායිම්:—

උතුරට: පී. බී. දෙල්දෙනිය අයිතිකම් කියන කොස්වත්තගොඩලන්ද, කැටකැරල්ලලන්ද, අළුබෝගහදෙනිය නම් ඉඩම් කට්ටිය; නැගෙනහිරට: දොන් ජානිස් පස්කුවල් අයිතිකම් කියන, කොස්වත්තගොඩලන්ද, කැටකැරල්ල, අළුබෝගහදෙනිය නම් ඉඩම් කට්ටිය; දකුණට: ඩී. ඒ. මුනසිංහ අයිතිකම් කියන, කොස්වත්තගොඩලන්ද,-කැටකැරල්ල, අළුබෝගහදෙනිය නම් ඉඩම් කට්ටිය; බස්නාහිරට: කොස්වත්තගොඩ නගර සභා පාර.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

අංකය: ජේ 59/60 ඇස් 178/ඇල්එච්. ඒ. 4078.
1960ක් වූ අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාලගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදායම් නිලධාරි කොටසේ මාතර නගර සභා සීමාව තුළ, කඩේ වීදිය උතුරේ පිහිටි (අංක 25/41.4 නැගෙනහිර දරණ නාගරික සැලැස්මේ අංක 252 දරණ) වාවුර උත්තම්තෝවටම් නමැති ඉඩමෙන්, බිම් ප්‍රමාණයෙන් අ. 0, රූ. 2ක් පමණ වූ බිම් කැබැල්ල, ඊට මායිම්:—

උතුරට: අංක 25/41.4 නැගෙණහිර දරණ නාගරික සැලැස්මේ, අංක 66 සහ 212 දරණ බිම් කැබලිද, මෙම ඉඩමට ඇති පාරද; නැගෙණහිරට: අංක 25/41.4 නැගෙණහිර දරණ නාගරික සැලැස්මේ, අංක 103 දරණ බිම් කැබැල්ලද, අංක 102 දරණ බිම් කැබැල්ලෙන් කොටසක්ද; දකුණට: අංක 25/41.4 බටහිර දරණ නාගරික සැලැස්මේ, අංක 105, 106 සහ අංක 67 දරණ බිම් කැබැල්ලෙන් කොටසක්ද; බටහිරට: අංක 25/41.4 බටහිර දරණ නාගරික සැලැස්මේ, අංක 67 දරණ බිම් කැබැල්ලෙන් කොටසක්ද වේ.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

අංකය: ජේ 57/58 එල්.ජී. 501/එල්. බී. 2365.
1960ක් වූ අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹදීය,

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම/පරවශතාව මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේයයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ පොල්කඩ පළාතේ පොල්කඩ නමැති ගමෙහි පිහිටි නාගහමුලවත්ත සහ නින්ද වත්ත නමැති ඉඩම්වලින් අ. 2, රූ. 2, ප. 0 පමණවූ පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් ප්‍රමාණය, ඊට මායිම්:—

උතුරට: කේ. පී. ඇස්. දිසානායකට අයිති ගලගෙදරගේවත්ත නමැති ඉඩම; නැගෙනහිරට: කේ. පී. ජෝන් සිංඤෝට අයිති නාගහවත්ත නමැති ඉඩම; දකුණට: ගම්සභා පාර; බස්නාහිරට: යූ. ආර්. සියාතුහාමි සහ අනිකුත් අයට හිමි උතුමුවේකුඹුර සහ කේ. පී. ඩිංගිරි බන්ඩාට අයිති නාගහවත්ත නමැති ඉඩම.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම සහ ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: 3/63/100 / ජේ 58/59 ඇස්. 919.
1960 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේයයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, ඇන්නොරුව පළාතේ දෙගම්මැද නමැති ගමෙහි පිහිටි මීල්ලගහමුල වත්ත (අංක 957 දරණ අ. ග. සැ. කට්ටි නො. 1ඒ කොටසක්) නමැති ඉඩමෙන් අක්කර 1/2 පමණවූ පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් ප්‍රමාණය, ඊට මායිම්:—

උතුරට: අංක 957 දරණ අ. ග. සැ. කට්ටි නො. 12 සහ දෙගම්මැද සිට විසිරියන්වෙල දක්වා ඇති ගම් සභා පාර; නැගෙණහිරට සහ දකුණට: දෙගම්මැද ඩබ්ලිව්. ඇම්. පුංචිබණ්ඩා සහ අනෙකුත් අයට හිමි එම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට: දිගනේවෙල ඇස්. බබානිස් සහ අනිකුත් අයට හිමි ආවාසේකැලේ (අංක 957 දරණ අ. ග. සැ. කට්ටි නො. 1) නමැති ඉඩම.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: 3/63/102 / ජේ 59/60 ඊ. 132.
1960 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම් මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේයයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

කෑගලු දිස්ත්‍රික්කයේ ගල්බොඩ කිණිගොඩ දෙකෝරළේ සහ පරණකුරු කෝරළේ මීපිටිය හා නිල්මල්ගොඩ ගම්වල පිහිටි නන්දන වත්තෙන් අක්කර 2 ක් විශාලත්වය ඇති බිම් කට්ටි දෙකක්.

බිම් කට්ටි අංක: 1.
විශාලත්වය අක්කර 1 රූඩ් 0, පර්චස් 3 ක් පමණ.
උතුරට: එම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: එම ඉඩමේ කොටසක් හා බංගලාවට යන පාර; දකුණට: ගම් සහා පාර; බස්නාහිරට: කුඹුම්රිසෙහේන නම් ඉඩම.

බිම් කට්ටි අංක: 2.
විශාලත්වය අක්කර 0, රූඩ් 3, පර්චස් 1 පමණ.
උතුරට: මීපිටිය-පරගම්මන ගම් සහා පාර; නැගෙනහිරට: හබුවෙහේන වත්ත නම් ඉඩම; දකුණට: පහලවෙල ඇල; බස්නාහිරට: කුඹුම්රිස්හේන නම් ඉඩම.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: ජේ 58/59 ඊ. 663 කේ.
1960 අප්‍රේල් මස 7 දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාල් ලාගේ හිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

1. කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ මීදෙනිය ගමේ පිහිටි හෙට්ටිවත්ත නම් ඉඩමෙන් අක්කර ⅞ ක් විශාලත්වය ඇති කොටස. ඊට මායිම්:—
උතුරට: කෑග/මීදෙනියේ සිංහල මිශ්‍ර පාසල් භූමිය (රජය සතු); නැගෙනහිරට: මීදෙනියේ ඇම්. වෙලසිදීන් පිල්ලේ අයිතිවාසිකම් කියන වාඩියකන්ද වත්ත නම් ඉඩම, (රජයට ගැනීමට අදහස් කරන) හා ගම්සහා පාර; දකුණට: බටුවත්ත රදගේ වත්ත නම් ඉඩම; බස්නාහිරට: ඇල හා එම ඉඩමේ කඩයක් ඇති කොටස්.

2. කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ මීදෙනිය ගමේ පිහිටි වාඩියකන්දවත්ත නම් ඉඩමෙන් අක්කර 1½ ක් විශාලත්වය ඇති කොටස. ඊට මායිම්:—
උතුරට: කලුකන්දහේන නම් ඉඩම; නැගෙනහිරට හා දකුණට: එම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට: හෙට්ටිවත්ත නම් ඉඩම (රජයට ගැනීමට අදහස් කරන).

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම සහ ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: 58/59 ඊ. 280.
1960 අප්‍රේල් මස 7 දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාල් ලාගේ හිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කිණිගොඩ දෙකෝරළේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ රන්කොත්දිවෙල වසමේ දෙවරගම්පොල ගමේ පිහිටි දිගන වත්ත නමැති ඉඩමෙන් අක්කර 1⅜ ක් විශාලත්වය ඇති කොටස. ඊට මායිම්:—
උතුරට: ගම්සහා පාර; නැගෙනහිරට: කේ. ඇම්. ඇස්. අබ්දුල් කදූර් අයිතිවාසිකම් කියන එම ඉඩමේ කොටසක් හා මුහම්දිරම් රාජ් බමුණුගේ ගෙයට යන පුද්ගලික පාර; දකුණට: මුහන්දිරම් රාජබමුණු අයිතිවාසිකම් කියන එම ඉඩමේ කොටසක්; බස්නාහිරට: ඩී. ආර්. විජේමාන්න අයිතිවාසිකම් කියන පොලොන් කැටිය කුඹුර නම් කුඹුර හා ගම්සහා පාරේ කොටසක්.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම සහ ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: ජේ. 58/59 ඊ. 915.
1960 අප්‍රේල් මස 7 දින,
කොළඹදීය.

අංකය: ඇල් එච්/ඞී. 23.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

බස්නාහිර පළාතේ ,කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ මුංවත්තේ බාගේ පත්තුවේ ලබුගම පිහිටි අංක ඒ 4,488 දරණ මුල් සැලැස්මේ කැබලි නො. 1, 2 සහ 3.

කැබලි නො. 1.
ඉඩමේ නම: පොත්තෙදෙනියහේන; විස්තරය: අවුරුදු 2ක්වූ නැවත වගා කරන ලද රබර් පැල 18ක් තිබේ; හිමිකම් කියන අය: ලොකුහේවගේ මෛත්‍රීපාල සහ ලොකුහේවගේ විජිත, ආර්. ඞී. නැන්සි නෝනා මහත්මිය බාරේ, ලබුගම, හල්තොට; ප්‍රමාණය: අ. 0, රු. 0, ප. 9.2.

කැබලි නො. 2.
ඉඩමේ නම: පොත්තෙදෙනියහේන; විස්තරය: අවුරුදු 35ක්වූ රබර් ගස් 156ක් සහ අඩි පාරෙන් කොටසක් තිබේ; හිමිකම් කියන අය: අයිවන් බාලසූරිය, එගොඩදෙනිය වත්ත, යාලගල, හල්තොට, ඞී. වී. බාලසූරිය, නුපෙ, මාතර; ප්‍රමාණය: අ. 1, රු. 1, ප. 3.5.

කැබලි නො. 3.
ඉඩමේ නම: පොත්තෙදෙනියහේන; විස්තරය: අවුරුදු 35ක්වූ රබර් ගස් 47ක් තිබේ; හිමිකම් කියන අය: අයිවන් බාලසූරිය, එගොඩදෙනිය වත්ත, යාලගල, හල්තොට; ඞී. වී. බාලසූරිය, නුපෙ, මාතර; ප්‍රමාණය: අ. 0, රු. 0, ප. 21.5.

මුළු ප්‍රමාණය: අ. 1, රු. 1, ප. 34.20.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ජූලි මස 28 වැනි දින පූ. භා. 10.30ට හොරණ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 ජූලි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

කි. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1960 මැයි 2 වැනි දින,
කළුතර කච්චේරිය.

---

අංකය: ඇල්.එච්/ඞී. 6.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුනේ කළුතර නගර සභා සීමාව තුළ අංක 5 දරණ කොට්ඨාශයේ වේලාපුර කළුතර පිහිටි අංක ඒ 4,432 දරණ මූලික සැලැස්මේ කැබලි නො. 1:

කැබලි නො. 1.
ඉඩමේ නම: පැලවත්ත. කෙලින් වීදියේ වරිපනම් අංක 1011/6න් කොටස; විස්තරය: අවුරුදු 30ක්වූ පොල් ගස් 2ක්ද අවුරුදු 20 සිට 30 දක්වාවූ රට දෙල් ගසක්ද අවුරුදු 10 සිට 15 දක්වාවූ පුවක් ගසක්ද සහිත වත්ත; හිමිකම් කියන අය: ඞී. ඩබ්ලිව්. කුලසේකර, 1011/6, කෙලින් වීදිය, කළුතර; ප්‍රමාණය: අ. 0, රු. 0, ප. 14.5.

මුළු ප්‍රමාණය: අ. 0, රු. 0, ප. 14.5.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ජූලි මස 26 වැනි දින පූ. භා. 10ට කළුතර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 ජූලි මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කි. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1960 මැයි 2 වැනි දින,
කළුතර කච්චේරිය.

---

සඳහන් කළ යුතු අංකය: ඇල්ඒ/සී/63.

## 1954රේ අඩක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අඩක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පොදු කටයුත්ත: පොල් ඔය පාලමට ප්‍රවේශ ඉදි කිරීම සඳහා.

ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ගරු ඇමති තුමා විසින් 57.7.31 දතමඹ සහ අංක ජේ 56 ඊ. 498 දරණ ප්‍රකාශයෙන් තීරණය, 57.8.16 දතම සහ අංක 11,157 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පරිදි:

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය: තල්පෙ පත්තුව ගම්මුලාදෑනි වසම: කතළුව බටහිර; ගම: අටදැහෙවතුගොඩ.

සැලැස්මේ අංකය: අංක ඒ. 1,778 දරණ මූලික සැලැස්ම.

**කැබලි අංකය: 1.**
ඉඩමේ නම: මෝදරවත්ත; විස්තර: අවුරුදු 15ක් වයසැති දොඹ ගස් දෙකක් සහ අවුරුදු 15 සිට 20 දක්වා වයසැති පොල් ගස් 21ක් සහිත වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 18.4.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ජූනි මස 28 වැනි දින පූ. හා. 10 ට ගාල්ලේ දිසාපති කාර්‍යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 ජූනි මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

හිමිකම් තහවුරු කිරීමට අදාල වන ඔප්පු සහ වෙනත් ලියකියවිලි විභාගය පවත්වන වේලාවේදී ඉදිරිපත් කළ යුතුයි.

අංක ඒ. 1,778 දරණ මූලික සැලැස්මේ පිටපතක් කතළුව බටහිර ගම්මුලාදෑනි තැනගේ කාර්‍යාලයේ බැලීම සඳහා තැන්පත් කර ඇත.

ඇන්. සී. ජයවීර,
ගාලූ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1960 මැයි මස 3 වැනි දින,
ගාල්ලේ කච්චේරිය.

---

## 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මුසලි ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ කොක්කුපඩයාන් ගම්මුලාදෑනි කොට්ඨාශයේ කොන්ඩච්චි ගමෙහි 2,204 දරණ මූලික සැලැස්මේ සම්පූර්ණ ලෙස පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

**කැබලි අංකය: 1.**
ඉඩමේ නම: නාගුරාර්තුන්ඩුකාටුපුලරු; විස්තර: මුඩු ඉඩම; හිමිකම් කියන්නෝ: සිලාවතුරෙ කොන්ඩච්චිහි පදිංචි නැඩුන්කුලතාර් මොහමඩ් යුසුප්, මීරා සාහිබු මොහොමඩ් ෂරීප් පුලවර්, අල්ලා පිච්චෙයි සුලෙයිමාන්, මීරාසාහිබු සේගු ජමාලුල්ලා සහ මීරා සාහිබු හමීඩු; ප්‍රමාණය: අ. 1, රූ. 3, ප. 28.6.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ජූනි මස 23 වෙනි දින පූ. හා. 9ට කොන්ඩච්චි ග්‍රාම සංවර්ධන ශාලාවේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 1960 ජූනි මස 9 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතව) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ජේ. ඇෆ්. ඩී. ලියනගේ,
මන්නාරම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා.

වෂී 1960ක්වූ මැයි මස 2 වෙනි දින,
මන්නාරම් කච්චේරියේදීය.

---

අංකය: ඇල්.ඒ. 172.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

ඌව පළාත බදුලු දිස්ත්‍රික්කය උඩුකිඳ ආදායම් නිලධාරි කොඨාශය උඩ පළාත කෝරළේ දෙහිපොල ගම්මුලාදෑනි කොටස, ගිරාඹෙ ගම: 516 ගම් සිතියමට උධෘත 1.

**කැබැලි අංක 246.**
ඉඩමේ නම: උඩුල්පත්දොවහේන; විස්තරය: හේන, ස්ථිර ගෙයක්ද ඇතුළත් වේ; හිමිකම් කියන අය: (1) ඇම්. ඇම්. මොහමඩ් මොහිදීන් මරික්කාර්, නො. 20, බැසර් වීථිය, වැලිමඩ; (2) එච්. ඇම්. අප්පුහාමි, අඹගහවත්ත, ගිරාඹෙ, අඹගස්දූව; බිම් ප්‍රමාණය: අ. 6, රූ. 3, ප. 23.

**කැබැලි අංක: 247.**
ඉඩමේ නම: සරේවත්ත; විස්තරය: කැලෑ ඉඩම සහ අවුරුදු 40ක් පමණ පැරණි තේ; හිමිකම් කියන අය: ජේ. ආර්. බී. ගුඩ්ලේපලෝ, සරේවත්ත, වැලිමඩ; බිම් ප්‍රමාණය: අ. 35, රූ. 2, ප. 15.

**මුළු ගණන: අ. 42, රූ. 1, ප. 38.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ජූනි මස 10 වැනි දින පූ. හා. 10ට බදුල්ලේ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 ජූනි මස 3 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම සහ එකී ඉඩම් ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ සම්බන්ධයෙන් පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇල්. අයි. ජේ. සිල්වා,
ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1960 මැයි මස 4 වැනි දින,
බදුලු කච්චේරිය.

---

## ශුද්ධියක්

සම්බන්ධිත අංකය: ජේ 57/58 ඇල් 601 "වීඊ"
ඇල් සී/ඇෆ්—5.

1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ "සංශොධිත" ආඥපනතින් සංශොධනය කරන ලද 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වන වගන්තියේ අංක 1 දරණ උප වගන්තිය යටතේ ගරු ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දාවූද අංක 11,721 දරණ 1959 අප්‍රේල් මස 9 වන දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද ප්‍රකාශනයට මෙහි පහත සඳහන් සංශොධනයන් එක් කරන ලදී.

"අ" අංක 1 දරණ ඉඩම් කැබැල්ලේ උතුරු මායිමට, අ. ග. සි. 212 කැබලි අංක 91ට ප්‍රථමයෙන් "ඇල" යන වචනය එක්කොට මෙසේ කියවිය යුතුයි.

" උතුරට : ඇල සහ අ. ග. සි. 212 කැබලි අංක 91 "

" ආ " අංක 6 දරණ ඉඩම් කැබැල්ලේ දකුණු මායිමට, අ. ග. සි. 216 කැබලි අංක 139ට ප්‍රථමයෙන් " 138 " යන අංකය එක්කොට " සහ 11 " යන වචනයද අංකයද " 139 "ට පසුව එක්කොට, " 216 " යන අංකය අත්හැර ඒ වෙනුවට " 218 " යන අංකය එක්කොට මෙසේ කියවිය යුතුයි.

" දකුණට : අ. ග. සි. 218, කැබලි අංක 138, 139 සහ 11—උඩගේහේන ".

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය : ඇල්. ඇස්. 4608.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වව්නියා දිස්ත්‍රික්කයේ කුලවිසුඩ්ඩාන් හි පිහිටි අක්කර 1/4ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්, සමිති ශාලාවක් පිහිටුවීම සඳහා, කුලවිසුඩ්ඩාන් කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියේ භාරකරුවන් වන සභාපති තනලච්චුමී, පොන්නම්බලම් රාසලච්චුමී හා සත්ගරපිල්ලේ සිවකුලන්දු යන මහත්මීන් විසින් බදු ඉල්ලා ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි. ඉඩමෙහි මායිම් මෙසේ ය :—

උතුරට : මාරයිලුප්පෙ—කුලවිසුඩ්ඩාන් ගම් සහා පාර ; දකුණට : කුලවිසුඩ්ඩාන් රජයේ ද්‍රවිඩ මිශ්‍ර පාඨශාලාව ; නැගෙනහිරට : ඇම්. සංගරපිල්ලේ මහතාට ඉ. ස. ආ. පනතේ යට දෙනලද ඉඩම ; බටහිරට : මාරයිලුප්පෙ—කුලවිසුඩ්ඩාන් ගම් සහා පාර.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 5 යි.
(ඉ) බද්ද : අවුරුද්දකට රු. 1 යි.
(උ) බදුගන්නන් විසින් බද්ද ආරම්භ වූ දින සිට අවුරුදු 1 ක් ඇතුළතදී වව්නියා දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි ශාලාවක් තනා නිමකළ යුතුය.
(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම ශාලාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙද විය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 මැයි මස 13 වැනි දින,
කොළඹදීය.

---

අංකය : ඇල්. ඇස්. 4320.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරිතුමාගේ කොට්ඨාශයට අයත් බී. ඕ. පී. 305 හේ ලොට්. 207න් අක්කර 2 ක් පමණවූ ආණ්ඩුවේ බිම් කැබැල්ලක් ගබඩා හා වී මෝලක් සෑදීම සඳහා සිංහපුර විවිධ සේවා සමුපකාර සමිතිය බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට තිබේ. සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසි වලටද යටත් කොට ඉඩම බදු දීමට යෝජනා කර ඇත :—

(අ) කාලය : අවුරුදු 30 යි.
(ඉ) බද්ද : අවුරුද්දකට රුපියල් 20 යි.
(උ) බදුගන්නා විසින් බද්ද ආරම්භවූ අවුරුදු 2 ක් ඇතුළත පොලොන්නරුවේ සමුපකාර උප කොමසාරිස්වරයා විසින් කලින් අනුමත කරන ලද සැලසුම් අනුව මෙම ඉඩමෙහි ගබඩා හා වී මෝලක් තනා නිමකළ යුතුයි.
(එ) බදුගන්නා විසින් මෙම ඉඩම ගබඩා හා වී මෝලක් තැනීම සඳහා මිස අන් කිසිම කරුණකට නොයෙදවිය යුතුයි.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 මැයි මස 13 වැනි දින,
කොළඹ දී ය.

---

අංකය : ඇල්. ඇල්. ඊ/ඒ. 60.

අංකය : ඇල්. ජේ. 1130.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

බදුල්ල දිස්ත්‍රික්කයේ, මහපළාත කෝරළයට අයත් උඩුකිඳ කොට්ඨාසයෙහි එත්තලපිටිය ගමෙහි, ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, ප. 37 ක් වන, අංක 26 දරණ අවසාන ගම් පිඹුරයේ, අංක. 310 දරණ බිම් කැබැල්ල, සම්බුද්ධ ජයන්ති ප්‍රදීපාලෝක කුළගන සමිතියේ භාරකරුවන් වන, බණ්ඩාරවෙල දික්උල්පොත පදිංචි, විජයසුන්දර මුදියන්සේලාගෙ මද්දුමමැණිකා, මෙස්තියගේ දෝන ලීලාවතී ගුණතිලක සහ ජොහානා රත්නායක යන මහත්මියන් විසින් මීට සැතැපුම් 1/4 ක් පමණක් ඈතින් පිහිටා තිබෙන බෞද්ධ විහාරස්ථානය පුළුල් කිරීම සඳහා බදු ඉල්ලා ඇත.

2. ඉල්ලුම් කරන ලද ඉඩමෙහි ආවාසයක් තැනීමට අදහස් කර ඇත. අක්කර 1/4 ක් පමණවන දැනට පන්සල පිහිටා තිබෙන පෞද්ගලික ඉඩමෙහි ගොඩනැගිලි කීපයක් තිබෙන බැවින් මේ සඳහා එය ප්‍රමාණවත් නොවේ. ගොඩනැගිලි තැනීම සඳහා සුදුසු අන් බිමක් පන්සලට තුදුරුව නොමැත. ඉල්ලුම් කරනු ලබන ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසි වලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත :—

(අ) බදු මුදල : වර්ෂයකට රු. 7.50.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුනු දින සිට අවුරුදු එකක් ඇතුලත දී බදුල්ලේ දිසාපති තැනගේ සිත්ගන්නා පරිදි ඉඩමෙහි ආවාසයක් තනා නිම කළ යුතුය.

(ඉ) බදු ගන්නන් විසින් මෙම ඉඩම බෞද්ධ පන්සලකට විනා අන් කටයුත්තක් සඳහා නොයෙද විය යුතුය.

(ඊ) බදු ගන්නන් විසින් (ආ) ඡේදයෙහි සඳහන් ගොඩනැගිල්ල සාදා නිම කොට සමසක් ඇතුලත එය මහාභාරකාර තැනගේ අනුමැතිය ලද ඔප්පුවකින් පූජා කළ යුතුය. මෙසේ කළ පසු, ප්‍රස්තාවේ හැටියට, භාරකාර තැනට හෝ විහාරස්ථානයේ පාලක විහාරාධිපතීන් වහන්සේට හෝ ඉඩම සඳහා 99 අවුරුද්දක බද්දක් දෙනු ලැබේ.

3. මෙහි පහත දැක්වෙන දිනයේ සිට සති 6 ක් ඇතුලත දී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 මැයි මස 13 වැනි දින,
කොළඹදීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.